


# කරුණාවක්, දයාවක්, සමාව දීමක් නොමැති චාල්ස් ඇන්තනීගේ වැඩ

සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න

ගින්දර සහ යුද්ධය එකම ස්වාභාවයෙන් යුක්තය. දැල්වෙන්නට පටන් ගත් විට කිසිම භේදයක් සැලකිල්ලට නොගිනියි. එය තමන්ටම උරුම උග්‍ර බවින් යුතුව කුරිරු තාණ්ඩව නැටුම ආරම්භ කරයි. විමුක්ති කොටින් සහ ලංකා රජය අතර වූ අවසාන යුද්ධයේ පළමු පියවර නැගෙනහිර පළාතෙන් අවසන් විය. ත්‍රිකුණාමලය සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවල කොටි පාලනය යටතේ පැවැති ප්‍රදේශ සියල්ලම හමුදාව විසින් අත්පත් කර ගන්නා ලදි. අවසානයට දෙදහස් හත වසරේ ජූලි මස එකොළොස් වන දින කුඩුම්බිමලෙ (තොප්පිගල) ප්‍රදේශයද හමුදාව අත්පත් කර ගත්තේය. සිය ගණන් සටන්කාමීන් මිය ගොස් සිටිය දී ඉතිරිව සිටින සටන්කාමීන් කැටුව ත්‍රිකුණාමලයේ සෙන්පති සෝර්ණම් සහ මඩකලපුවෙහි සෙන්පති බානු තම පරාජය උර මත තබාගෙන වන්නියට පැමිණියෝය.

කොටි සංවිධානයේ නායකතුමා වන ප්‍රභාකරන්, රහස් තොරතුරු අංශය භාර පොට්ටු අම්මාන් ඇතුළු අතේ ඇඟිලි ගණනට අයත් සුළු පිරිසක් පමණක් යුද්ධය නැවත ආරම්භ කිරීමේ මහත් උනන්දුවකින් උන්හ. සටන්කාමීන්ගේ මානසික ශක්තිය එළියට ප්‍රකාශ නොකළත් අභ්‍යන්තරයෙහි පැවතුණේ දුර්වල බවකින් යුතුවය. මෙය බොහෝ සෙන්පතිවරු හොඳින් තේරුම් ගෙන උන්හ. ඒ වන විටත් දුර්වල තත්ත් වයකට පත්ව තිබූ කොටින්ගේ ප්‍රහාරක ශක්තිය සටන් පෙරමුණෙහි ඉදිරියෙන් සිට මෙහෙයවන සෙන්පතිවරු සහ අංශ භාරකරුවන්ට යුද්ධයෙන් ජය ලැබිය හැකිය යන විශ්වාසය ඇති කිරීමට සමත් වූයේ නැත. මාවිල්ලාරු අයුරින් හමුදාව ඉදිරියේ පරාජය වූ බවට සෙන්පති සෝර්ණම් සටන්කාමීන්ගේ විවේචනයට ලක් වූයේය.

දෙදහස් හත වසරට පසු කාලයේ දී වන්නි ප්‍රදේශය කොටි පාලනයට නතු වූ එකම එක ප්‍රදේශය බවට පත් විය. කොටි සංවිධානය සතුව තිබූ බොහෝ ආයුධ, විශේෂයෙන්ම දුර විහිදුම් කාල තුවක්කු උණ්ඩ, මුහුදු යුද්ධවල දී භාවිත කෙරෙන බර ආයුධ ආදිය ඉතාමත් අධික විය. මෙවැනි විශේෂ ආයුධවල සැබෑ නම් සටන්කාමීන්ට පවසන්නේ නැති අතර ආයුධ භාවිත කෙරුණේ බොහෝ විට සංකේත නාමයන්ගෙනි. අවසන් යුද්ධය සිදු කෙරුණු අවස්ථාවේ සටන්කාමීන්ගේ ප්‍රහාරක බළඇණිවලට වඩා ආයුධ ගබඩා කෙරෙහි සංවිධානය මහත් විශ්වාසය තබා තිබුණි.

සාමයෙහි අවසන් කාලය වූ දෙදහස් හය වසරට පසුව කොටින්ගේ ආයුධ නැව් සමහරක් ජාත්‍යන්තර මුහුදේ දී දිගින් දිගට ගිල්වා දැමීය. ත්‍රිකුණාමලය වරාය ප්‍රදේශයේ ලංකාවේ නාවික හමුදාව නැව්වල ගමන් කිරීම නිරීක්ෂණය කරන ඉතාමත් නවීන රාඩා උපකරණ සවි කර සැක සහිත නැව් පිළිබඳව අවධානයෙන් සිටියහ. එවැනි නැව්වල ගමන් කිරීම පිළිබඳව තොරතුරු ඉන්දීය වෙරළාරක්ෂක භටයන්ගෙන් ද ලංකාවේ නාවික හමුදාව ලබා ගත්තේය. කොටි සඳහා ආයුධ පටවාගෙන පැමිණි නැව් අවම වශයෙන් තුනක්වත් ජාත්‍යන්තර මුහුදු සීමාවෙහි දී ලංකාවේ නාවික හමුදාව විසින් පහර දී විනාශ කරනු ලැබිණ. මෙම පුවත් දැනගත් ජනතාව 'මොනවද දරුවෝ පිටරටවල ඉන්න අපේ මිනිස්සුන්ගේ සල්ලි නේද මේ විදිහට නිස්කාරණේ මුහුදේ පිච්චිලා විනාශ වෙන්නේ'' යැයි අපට දොස් පැවරූ අවස්ථා ද ඇත. කොටින්ගේ ආයුධ නැව් මෙසේ පහර දී විනාශ කිරීම හේතුවෙන් සංවිධානය සතුව තිබූ කාලතුවක්කුවලට අවශ්‍ය උණ්ඩ සහ වෙනත් පුපුරන ද්‍රව්‍ය දිගින් දිලටම පිටරටවල සිට ගෙන්වා ගෙන යුද්ධයේදී හිතූ මතේ භාවිත කිරීමට ඇති හැකියාව නැති විය.

අවසන් යුද්ධයේ ආරම්භක පියවරේදී ලංකාවේ හමුදාව විසින් සිදු කරන ලද හමුදා ක්‍රියාන්විතයන් ව්‍යර්ථ කිරීම සඳහා වන කොටින්ගේ ප්‍රතිප්‍රහාරවල දී කාලකුවක්කු සහ වෙනත් දුර විදින ආයුධ සඳහා හොඳින් වෙඩි බලය සපයා සටන් පෙරමුණෙහි සිටි ප්‍රහාරක බළඇණිවලට ප්‍රබල ශක්තියක් සපයන්නට විය. කොටින්ගේ බල පිරිස් හිඟය සපුරා ගනිමින් යුද්ධ භූමියේදී හමුදාවට විශාල විනාශයක් ඇති කර ඔවුන්ගේ ඉදිරියට ඒමේ ක්‍රියාන්විතය ව්‍යර්ථ කිරීමෙහිලා කොටින්ගේ කාලතුවක්කු බලකාය මහත් කාර්යභාරයක් ඉටු කළේය. එහෙත් පසුව පැවැති යුද ගැටුම්වලදී කොටින් මුහුණ පෑ කාලතුවක්කු උණ්ඩ හිඟය හේතුවෙන් මෙවැනි වෙඩි බලයක සහය ඉතාමත් සීමිත විය. අධික දුර පරතරයකින් යුතු මුර කපොලුවල ඉතාමත් අඩු සංඛ්‍යාවකින් යුතුව ස්ථානගත කර තිබූ සටන්කාමීන්ට තම අතෙහි වූ තුවක්කුවට වඩා ඔවුන්ගේ පසුබිමෙන් එල්ල කරන කාලතුවක්කු උණ්ඩ වර්ෂාව මහත් ආධාරයක් විය.

තමන් ඉදිරියට පැමිණෙන හමුදාව දුටු වහාම කාලතුවක්කු ප්‍රහාරවල ආධාරය ලබා දෙන ලෙස 'තම ප්‍රදේශයේ අණදෙන මධ්‍යස්ථානවලට ඔවුහු දැනුම් දුන්හ. මේ නිසා සටන් පෙරමුණේ භටයන් මෙහෙයවන කොටින්ගේ මධ්‍යම නායකත්වයේ සෙන්පතිවරුන් හා කාලතුවක්කු බළඇණිය ප්‍රායෝගිකව මහත් දුෂ්කරතාවයන්ට මුහුණ දුන්නේය. මේ අතර වර්ෂාවක් ලෙසින් එල්ල වන කාලතුවක්කු හමුදාවේ ප්‍රහාරවල ආධාරයෙන් හා වෙඩි නොවදින ඇඳුම් ඇඳගෙන පී.කේ. වර්ගයේ ප්‍රහාරක අවිවලින් ප්‍රහාර එල්ල කරමින් ඉදිරියට එමින් සිටි හමුදාවට එරෙහිව සටන් කිරීමට නොහැකි තත්ත්වයක් කොටින්ගේ සටන් පෙරමුණේ ප්‍රහාරක බළඇණිවලට ඇති විය. මෙම තත්ත්වය මත කොටින්ගේ ප්‍රහාරක බළඇණිවලට ක්‍රමක්‍රමයෙන් පසුබැසීම හැර වෙනත් විකල්පයක් නොතිබුණි.

රට අභ්‍යන්තරයෙහි කාලතුවක්කු උණ්ඩ සහ බෝම්බ නිශ්පාදනය කිරීමේ උත්සාහයන්හි ප්‍රභාකරන් නායකතුමාගේ වැඩිමහලු පුත් චාල්ස් ඇන්තනී නිමග්න වූයේය. බලගතු සටන්කාමීන් සංඛ්‍යාවක් සහ ආර්ථික සම්පත් සහිත වූ 'පරිගණක අංශය' ක්‍රියාත්මක වූයේ ඔහුගේ නායකත්වය යටතේය. නායකතුමාගේ ඉතාමත් විශ්වාසවන්ත මිතුරා වූ දෙවන ලුතිතන් ශීලන් යනුවෙන් සංවිධානය තුළ හැඳින් වුණු චාල්ස් ඇන්තනීගේ නම නායකතුමා තම වැඩිමහලු පුතුට තැබුවේය. චාල්ස් ඇන්තනීගේ චින්තනයන් ද ක්‍රියාකාරකම් ද වෙනස් අන්දමේ ඒවා විය. ප්‍රායෝගිකව කළ හැකිද? නොහැකිද? යන්න පිළිබඳව ඔහු සැලකිල්ලක් දැක්වූයේ නැත. සියලු දෙනා 'තම්බි' (මල්ලි) යනුවෙන් හැඳින් වූ චාල්ස් ඇන්තනී අවසන් යුද්ධයේ දී සංවිධානයේ අනිවාර්ය පිරිස් බඳවා ගැනීමේ කටයුතුවල දී සහ සටන් පෙරමුණු කටයුතුවල දී නායකත්වය ගෙන කටයුතු කළේය.

චාල්ස් ඇන්තනී විසින් ගනු ලබන ක්ෂණික තීරණ සමහර අවස්ථාවල ඔහුව ළදරුවෙකුව සිටි සමයේ වඩාගෙන හුරතල් කළ සංවිධානයේ ජ්‍යෙෂ්ඨ සෙන්පතිගේ පවා සිත් බිඳෙන සිදුවීම් බවට පත් වූ බව දැන ගන්නට ලැබිණි. ප්‍රහාරක සෙන්පතිවරුන්ගේ රැස්වීම්වල දී චාල්ස් ඇන්තනී අත්දැකීම් බහුල සෙන්පතිවරුන් අවමානයට ලක් කෙරෙන අන්දමින් අදහස් ඉදිරිපත් කරන බවත්, සෙන්පති විදූෂා බොහෝ අවස්ථාවල මා සමඟ පවසා ඇත.

සියලුම ජනතාව සෘජුවම සටන් පෙරමුණෙහි දායකත්වය සැපයිය යුතු බව චාල්ස් ඇන්තනීගේ අදහස විය. එහෙයින් අනිවාර්ය පිරිස් බඳවා ගැනීමේදී කිසිම කරුණාවක්, දයාවක් හෝ සමාව දීමක් හෝ අවශ්‍ය නොමැත යන පදනමින් ඔහුගේ ක්‍රියාකාරකම් සකස්ව තිබිණි. දේශපාලන අංශයට අයත් පිරිස් අනිවාර්ය බඳවා ගැනීම් කටයුතුවල දැඩි ලෙසින් ක්‍රියාත්මක නොවී උදාසීනව කටයුතු කරන්නේය යන චෝදනාව ඔහු විසින් ඉදිරිපත් කරන ලදි. එහෙයින් තම පරිගණක අංශයත්, පොලිස් අංශයත් එක්ව මුල්ලිවයික්කාල් දක්වා අනිවාර්ය පිරිස් බඳවා ගැනීම් සිදු කළේය. සටන්කාමීන් සඳහා වන මූලික පුහුණු කඳවුරු ද තම අධීක්ෂණය යටතේ පැවැත්වීය. එම සටන්කාමීන් සමඟ ඔහු ද සටන් පෙරමුණට ගියේය. සංවිධානයෙන් ඉවත්ව සිටි සහ ඉවත් කළ සටන්කාමීන් ද තමන් සමඟ එකතුව ක්‍රියාත්මක කිරීමට ඔහු උත්සාහ කළේය. කෙටි කාලයක් තුළ වුව චාල්ස් ඇන්තනී විමුක්ති කොටි සංවිධානය තුළ ස්වීය ශෛලියක් නිර්මාණය කර ගෙන කිසිම දෙයක් පිළිබඳව හෝ පැකිළීමකින් තොරව කටයුතු කරමින් උන්නේය.

දෙදහස් හය වසරේදී සංවිධානයේ පිරිස් බලය වැඩි කිරීම සඳහා අනිවාර්ය බඳවා ගැනීම් යන සැලැසුම ක්‍රියාත්මක කිරීමේ දී සංවිධානයේ තවත් බියකරු මුහුණක් ජනතාවට ප්‍රදර්ශනය විය. සටන්කාමීන්ගේ රැස්වීමක දේශපාලන අංශ භාරකරු මෙම නිවේදනය ප්‍රකාශ කළ මොහොතේ බොහෝ සටන්කාමීහු කම්පනයට පත්වූහ.

''අපි ළඟ ආයුධ ඕනෑතරම් තියනවා. පිරිස් බලය තමයි නැත්තේ. නායකතුමා බලාපොරොත්තු වෙන පිරිස් බලය ලැබුණොත් මේ යුද්දෙදි අපි තමයි දිනන්නේ. මුහුද ගොඩබිම ගුවන් කියන ත්‍රිවිධ හමුදාවේ ශක්තිය සංවිධානය සතුව තියනවා. අත්දැකීම් තියන සෙන්පතිවරු ඉන්නවා. ඒ හැමෝටම වැඩිය නායකතුමා ඉන්නවා. නායකතුමා බලාපොරොත්තු වෙන පිරිස් බලය පමණක් තියනවා නම් මේක තමයි දෙමළ ඊළම සඳහා වෙන අන්තිම සටන. ගෙදරකින් එක්කෙනෙක් දෙන්නෙක් විතරක් සංවිධානයේ ඉඳලා මදි. සටන් කරන්ඩ ශක්තිය තියන හැමෝම ආයුධ අතට අරගෙන සටන් කරන්ඩ ඉදිරියට එන්ඩ ඕනෑ. ඒ නිසා ඔබලා පසුබට නොවිය යුතුයි. තරුණ තරුණියන් සංවිධානයට බඳවා ගන්න ඕනෑ. ඒක තමයි නායකතුමාගේ බලාපොරොත්තුව.''

දේශපාලන අංශ භාරකරු මෙය සටන්කාමීන් මධ්‍යයෙහි පැවසූ අවස්ථාවේ ඇත්තෙන්ම ජනතාව මෙය කෙසේ භාර ගනී ද යන්න මට සිතා ගත නොහැකි විය. බොහෝ සටන්කාමීන්ගේ හැඟීම් ද මගේ හැඟීම්වලට සමාන විය. එහෙත් එවැනි අවස්ථාවක මගේ අදහස හෙළිකර සිටීම නායකත්වයෙහි අණ කඩකරන ද්‍රෝහී ක්‍රියාවක් ලෙසින් අදහස් කළ හැකිය. සංවිධානයේ නායකත්වය විසින් තීරණය කරන ලද දෙයක් ක්‍රියාත්මක කිරීම සටන්කාමීන්ගේ වගකීම වෙයි. එසේ නොමැති අදහස් ඉදිරිපත් කිරීම යනු අරගලය තුළ කළහකාරී තත්ත්වයක් ඇති කරන ක්‍රියාමාර්ග යක් ලෙසින් සැලකිණ.

